# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| දිනය | 2024.10.30 |


## කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය 2024 ඔක්තෝබර් මාසයේ දී ද සෘණ අගයක් වාර්තා කළේය.

| උද්ධමනය කො.පා.මි.ද., (2021=100) | 2024 සැප්තැම්බර් | 2024 ඔක්තෝබර් |
|---|---|---|
| දර්ශක අගය | 190.9 | 189.9 |
| මාසික වෙනස (%) | -0.12 | -0.53 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | -0.5 | -0.8 |

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද කෙටි කාලීන උද්ධමන පුරෝකථන හා අනුකූලව, අඛණ්ඩව දෙවන මාසයටත් සෘණ අගයක පවතිමින් 2024 සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූ සියයට 0.5ක අවධමනයට සාපේක්ෂව 2024 ඔක්තෝබර් මාසයේ දී සියයට 0.8ක අවධමනයක් වාර්තා කළේය.

වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, ආහාර නොවන කාණ්ඩයෙහි 2024 සැප්තැම්බර් මාසයේ වාර්තා වූ සියයට 0.5ක අවධමනයට සාපේක්ෂව 2024 ඔක්තෝබර් මාසයේ දී සියයට 1.6ක අවධමනයක් වාර්තා විය. කෙසේ වුවද, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, ආහාර කාණ්ඩයෙහි 2024 සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූ සියයට 0.3ක අවධමනයට සාපේක්ෂව 2024 ඔක්තෝබර් මාසයේ දී සියයට 1.0ක උද්ධමනයක් වාර්තා විය.

**කො.පා.මි.ද. (2021=100) මාසික % වෙනස සඳහා දායකත්වය**




මාසික පදනම මත මනිනු ලබන කො. පා. මි. දර්ශකය 2024 ඔක්තෝබර් මාසයේ දී සියයට 0.53ක පහළ යෑමක් වාර්තා කළේය. මේ සඳහා, ආහාර කාණ්ඩයේ අයිතමවල වාර්තා වූ සියයට 0.20ක මිල පහළ යෑම සහ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල වාර්තා වූ සියයට 0.33ක මිල පහළ යෑම හේතු විය. මේ අතර, ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරන මූලික උද්ධමනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 2024 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 3.3හි සිට 2024 ඔක්තෝබර් මාසයේ දී සියයට 3.0ක් දක්වා සුළු වශයෙන් පහළ ගියේය.

ඉදිරි කාලය පිළිබඳව සලකා බැලීමේ දී, ප්‍රධාන වශයෙන් පරිපාලිත මිල ගණන් වෙනස් කිරීම් සහ සැපයුම් අවහිරතා ලිහිල් වීම හේතුවෙන් මෙම අවධමන තත්ත්වය මාස කිහිපයක් තවදුරටත් පවතින බවට පුරෝකථනය කෙරේ. කෙසේ වුවද, ඉන් අනතුරුව, සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහායයෙන්, උද්ධමනය සියයට 5ක ඉලක්කගත මට්ටම හා ක්‍රමයෙන් සමපාත වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**මතුපිට උද්ධමනයේ පුරෝකථන[(අ)]**

**කොළඹ පාරිභෝගික මිල දර්ශකය,[(ආ)] කාර්තුමය සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය, %**

2024 සැප්තැම්බර් මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව




උද්ධමන ව්‍යාප්ති සටහන (Fan chart) මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ.

අයහපත් කාලගුණ තත්ත්ව හේතුවෙන් කෘෂිකාර්මික නිෂ්පාදනයට සිදුවන බලපෑම; ඉහළ වැටුප් සඳහා ඇති ඉල්ලුම සාක්ෂාත් වීමට ඇති හැකියාව; අවිනිශ්චිතතා මධ්‍යයේ ගෝලීය ආහාර සහ බලශක්ති මිල කෙරෙහි ඇති විය හැකි ඉහළ පීඩනය; ඉහළ මට්ටම්වලින් රුපියල අවප්‍රමාණය වීමට ඇති හැකියාව; සහ අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා මාර්ගයෙන් යම් අපගමනයක් සිදු වීමට ඇති හැකියාව වැනි සාධක මගින් උද්ධමන පුරෝකථන ඉහළ යෑමේ බලපෑම් ඇති කළ හැකිය. මේ අතර, උද්ධමන පුරෝකථන පහළ යෑමේ අවදානම් සැලකූවිට, අනෙකුත් සාධක අතර, අත්‍යාවශ්‍ය ද්‍රව්‍යවල සිදු විය හැකි මිල අඩු කිරීම්; මහජනතාවගේ මිලදී ගැනීමේ ශක්තිය හීන වීමේ දිගු කාලීන බලපෑම; සහ ඉදිරියේදී සිදු විය හැකි භාණ්ඩ හා සේවා මත බදු අඩු කිරීම් වල සෘජු බලපෑම ඇතුළත් වේ.

***මූලය**: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන*

(අ) මෙහි පෙන්වා දී ඇති උද්ධමන ව්‍යාප්ති සටහනෙහි දක්වා ඇති පුරෝකථන මගින් 2024 වසරේ සැප්තැම්බර් මාසයේ පුරෝකථන වාරයේ දී පැවති දත්ත, උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරේ.

(ආ) 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100, සෘතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වන අතර මෙම කාල සීමාවෙන් පසු දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100, සෘතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ. එම සියලුම ප්‍රකාශිත දත්ත මත පුරෝකථන පදනම් වේ.

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

### උප කාණ්ඩ අනුව කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය
### (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)




## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2021=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2023 | ඔක්තෝබර් | 191.4 | 172.4 | -0.2 | 0.2 | 1.5 | 1.2 | - | - |
| | නොවැම්බර් | 193.4 | 172.4 | 1.0 | 0.0 | 3.4 | 0.8 | - | - |
| | දෙසැම්බර් | 195.1 | 172.5 | 0.9 | 0.1 | 4.0 | 0.6 | 17.4 | 14.5 |
| 2024 | ජනවාරි | 200.7 | 176.2 | 2.9 | 2.1 | 6.4 | 2.2 | 14.2 | 11.3 |
| | පෙබරවාරි | 200.6 | 177.2 | 0.0 | 0.6 | 5.9 | 2.8 | 11.3 | 8.5 |
| | මාර්තු | 196.7 | 177.3 | -1.9 | 0.1 | 0.9 | 3.1 | 8.0 | 6.1 |
| | අප්‍රේල් | 195.2 | 177.3 | -0.8 | 0.0 | 1.5 | 3.4 | 5.7 | 4.4 |
| | මැයි | 194.1 | 177.0 | -0.6 | -0.2 | 0.9 | 3.5 | 3.9 | 3.3 |
| | ජූනි | 195.6 | 177.4 | 0.8 | 0.2 | 1.7 | 4.4 | 3.1 | 2.8 |
| | ජූලි | 194.7 | 177.9 | -0.5 | 0.3 | 2.4 | 4.4 | 2.8 | 2.7 |
| | අගෝස්තු | 191.1 | 177.3 | -1.8 | -0.3 | 0.5 | 3.6 | 2.5 | 2.7 |
| | සැප්තැම්බර් | 190.9 | 177.6 | -0.1 | 0.2 | -0.5 | 3.3 | 2.4 | 2.8 |
| | ඔක්තෝබර් | 189.9 | 177.5 | -0.5 | -0.1 | -0.8 | 3.0 | 2.2 | 2.9 |

සටහන: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය සහ මාසික වෙනස, වටයන ලද දර්ශකාංක භාවිතා කර ගණනය කර ඇත.

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව